

ගුරු-බුධ-රාහු විපරීත පිහිටීමක

නින්දිත යුද්ධයක් පටන් ගන්නවා

ආණ්ඩුවේ ලොකු පුටු අසීරුවේ

විපක්ෂයේ නායකයන්ට කට වරදිනවා

# මළ කෙළියයි ජූලි 07න් පස්සේ ලොකු කලබලයක්

**එළැඹෙන ජූලි 07 වැනිදා සිට මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ යම් අනපේක්ෂිත, විපරීත සිදුවීම් රාශියක් සිදුවිය හැකි බව ප්‍රවීණ ජ්‍යොතිෂවේදී කේ.සී.ජේ. රත්නායක මහතා පවසනවා. ඒ අනුව එම කාලයේ ආණ්ඩුවට සේම විපක්ෂයටද යම් යම් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය හැකි බවයි රත්නායක මහතා සඳහන් කරන්නේ. KCJ Astrology යූටියුබ් නාලිකාවෙන් උපුටාගත්, රත්නායක මහතාගේ එම ජ්‍යොතිෂ විද්‍යානුකූල පැහැදිලි කිරීම 'මව්රට' පාඨක ඔබ වෙනුවෙන් අප මෙලෙස ඉදිරිපත් කරමු.**

අද මම, එළැඹෙන ජූලි 07 වැනිදා ගැන විශේෂ යමක් සඳහන් කරන්න හිතුවා. කිසියම් කෙනකුට නොසිතූ විරූ ඇබැද්දියක් වුණාම, හිතාගන්න බැරි දෙයක් වුණාම ඒ කාලේ කිව්වේ 'මළ කෙළියයි ජූලි හතයි' කියලා. ඒ දෙක අතර සම්බන්ධය මොකක් නමුත් පුදුමය දනවන්න වගේ කිව්වේ 'මළ කෙළියයි ජූලි හතයි' කියලා. ඒ කොහොම වුණත්, මේ අවුරුද්දේ ජූලි මාසය දිහා බලනකොටත් මට ඒ විදියටම හිතුණා. මොකද අනපේක්ෂිත දේවල් ටිකක් සිදුවෙන්න අවශ්‍ය ග්‍රහචාරය මේ වෙද්දි සකස් වෙලා තියෙන නිසා.

අපි බලමු දැන් මේ කියන ජූලි 07 වැනිදායින් පසුව ශ්‍රී ලංකාව තුළ සිදුවිය හැකි දේවල් මොනවද කියලා. ඇත්ත - නැත්ත මොකක්ද කියලා හොයාගන්න බැරි වෙන විදිහේ, ඇත්ත සහ නැත්ත මිශ්‍ර වෙච්ච ලිපි ලේඛන, හඬපට, ඡායාරූප, වීඩියෝ, දුරකතන සංවාද මෙන්න මේවා කවදාකවත් නොවූ විරූ ලෙස සමාජ මාධ්‍ය ඔස්සේ පැතිරෙන්න පටන් ගන්නවා. ඒවා ඇත්තටම දේශපාලනික අරමුණු ඇතිවත් යම් යම් පුද්ගලයන් ඉලක්ක කරගෙනත් ඒ අයට අගතියක් ඇති කරගනු පිණිසත් ඇතිවන යුද්ධයක් හැටියටයි පෙන්නන්නේ. ඇත්තටම මේක නින්දිත යුද්ධයක්. මොකද ඇත්ත කරුණුවලින් යනවාට වඩා පෙනෙන්නේ නිර්මාණාත්මක අංශයකුත් අරගෙන ග්‍රාහකයා, එහෙම නැත්නම් ඒවා කියවන්නා, අසන්නා පිස්සු වැටෙන ආකාරයේ තත්ත්වයක්. කවුද ඇත්ත කියන්නේ, කවුද බොරු කියන්නේ, කොයි එකද ඇත්ත, කොයි එකද නැත්ත කියන විදිහේ මහා ව්‍යාකූල තත්ත්වයක් හටගන්නවා.

දේශපාලන වශයෙන් තමයි මේ පිල් බෙදීම හටගන්නේ. අපි දන්නවා ඒ පිල් බෙදීම හටගන්නේ කොහොමද කියලා. පැහැදිලිව එක් කොටසක් ආණ්ඩු පක්ෂයට, අනෙක් කොටස විපක්ෂ කොටස් අතර බෙදී යනවා. ආණ්ඩුව සහ විපක්ෂය අතර කෙරෙන ඒ මාධ්‍ය යුද්ධය, මාධ්‍ය සටන ඇතුළේ බර අවි හැටියට මම කලින් කිව්ව ලිපි ලේඛන, හඬපට, ඡායාරූප, වීඩියෝ මේවා ඔබ නිරීක්ෂණය කරන්න දකින්න ලැබෙයි. එහෙම ප්‍රවණතාවක් තමයි මේ පවතින ග්‍රහචාරය අනුව මට පෙන්නුම් කරන්නේ. ඒ කියන්නේ විකෘති කරන ලද, ඇතැම් විට අතිශයෝක්තියට නංවන ලද ප්‍රචාරයන් දකින්න ලැබෙයි.

ඔබ දන්නවා මම පේන දේ කියනවා මිසක් මම කියන දෙයින් කවුද වාසිය ගන්නේ කියන එක ගැන මගේ සැලකිල්ලක් නැහැ. ඇතැම් විට ඒ වාසිය ආණ්ඩු පක්ෂයට යන්නත් පුළුවන්, විපක්ෂයට යන්නත් පුළුවන්, ඇතැම් විට දෙපැත්තටම පාඩු වෙන්නත් පුළුවන්. හැබැයි මගේ විෂය පේන දේ කියන එක. නැවත ඒක අවධාරණය කරන්න ඕනේ මම මේ කියන එකෙන් කාට වාසියක් වෙනවද අවාසියක් වෙනවද කියන එක ගැන මගේ තැකීමක් නැහැ. නමුත් මේ සිදුවෙන මාධ්‍ය යුද්ධය ඇතුළේ මේක ඔබ නිරීක්ෂණය කරන්න, මෙතෙක් කිසිදා නොවූ විරූ විදිහට මේ තත්ත්වය එන්න පටන් ගන්නවා.

එතකොට මේකට අදාළ ග්‍රහයෝ කවුද කියලා ගත්තොත් ගුරු, බුධ, රාහු. මෙන්න මේ ග්‍රහයෝ තුන්දෙනාගේ තත්කාලීන පිහිටීම තමයි මේ විපරීත තත්ත්වය උද්දීපනය කරන්නේ. ඒකට පැහැදිලිවම ගුරු දැන් ඉන්න තැනත්, රාහු ඉන්න තැනත් බලපානවා. හැබැයි ඒක සක්‍රීය කරන්නේ බුධ කියන ග්‍රහයාගේ ක්‍රියාකාරීත්වය. එතකොට මේ බුධගේ ගමන අනුව ඇතැම් විට සත්‍යයමත් කියැවෙනවා. ඒ කියන්නේ ගුරුගේ බලය වැඩි වුණාම සත්‍යය කියැවෙනවා, සත්‍යය එළියට එනවා. හැබැයි රාහුගේ බලය වැඩි වෙනකොට තනිකර අසත්‍යයමයි, විකාරයක්මයි එළියට එන්නේ. කොහොම නමුත් මේ මුල් සති තුනේදී ඒ කියන්නේ ජූලි 07 වැනිදා සිට පළමු සති තුනේදී මේ බර අවි ප්‍රහාරයෙන්, නැත්නම් මේ මාධ්‍ය යුද්ධයෙන් ආණ්ඩු පක්ෂය සහ එහි බලවත් පුටු, ලොකු තනතුරු දරන අය සැහෙන අසීරුවකට ලක් වෙන්න පුළුවන්.

ඒ වගේම හතර වැනි සතියේ ඉඳලා ඒ තීව්‍රතාව අඩු වෙනවා. ඒ කියන්නේ ඒ තරම් ලොකු කලබැගෑනියක් ආන්දෝලනයක් හටගන්නෙ නෑ. නමුත් දිගින් දිගටම ඊට පස්සේ සැප්තැම්බර් මාසය අවසාන වන තෙක්ම ආන්දෝලනාත්මක ප්‍රවෘත්ති අහන්න දකින්න ලැබෙනවා. මේක පාලනය කරගත්තේ නැතිනම් හෝ හරියට ඒකට මුහුණ දුන්නේ නැතිනම් එහි වැඩි පාඩුවක් සිද්ධ වෙන්න නියමිතව තියෙන්නේ ආණ්ඩු පක්ෂයට.

ඊළඟට පේන දෙවැනි පුරෝකථනය තමයි ඒ තත්ත්වයට සමාන්තරව විපක්ෂයේ ඉන්නවනේ මුල් පෙළේ චරිත, විපක්ෂ නායකයා වගේ. මෙන්න මේ අයත් බරපතළ විදියට කට වරද්දා ගන්නවා. වචන වරද්දා ගන්නවා. උචිත අනුචිතභාවය නොදැන අදහස් පළකරන්න ගිහිල්ලා, ඇතැම් වචන පාවිච්චි කරන්න ගිහිල්ලා විශාල සමාජ අපකීර්තියකට පත්වීමේ අවදානමක් තියෙනවා. ඒකත් මේ කාලසීමාවමයි. ජූලි 07 වැනිදා සිට සැප්තැම්බර් දක්වා.

ඒ වගේම තවත් සංවේදී පුරෝකථනයක් තියෙනවා කරන්න. ඒ තමයි පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය. උසස් අධ්‍යාපන, විශ්වවිද්‍යාල මට්ටම නෙමෙයි මේ කියන්නේ. ප්‍රාථමික සහ ද්විතීයික පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධව සහ අපේ බාල පරම්පරාව සම්බන්ධව යම් යම් අසතුටුදායක පීඩනකාරී තත්ත්වයන් අහන්න දකින්න ඉඩකඩ තියෙනවා. ඔවුන් අනපේක්ෂිත පීඩනයකට ලක්වීමට ඉඩකඩ තියෙනවා මේ පවතින ග්‍රහ පිහිටීම් අනුව. ඒ වගේම විශේෂයෙන්ම ළමයින්ම ඉලක්ක කරගත්තු, අපේ බාල පරම්පරාව ඉලක්ක කරගත්තු සෞඛ්‍යමය තර්ජන, කායික හා මානසික කියන දෙපැත්තෙන්ම මතුවීමේ අවදානමකුත් පෙන්නුම් කරනවා.

ඊළඟට අන්තර්ජාල සබඳතා. ඒ වගේම ඒකේ තාක්ෂණික පැත්ත ගැන මම මේ කියන්නේ. ඒ වගේම සමාජ මාධ්‍ය, ඒ වගේම සම්ප්‍රදායික ජනසන්නිවේදන අංශ, ලංකාව සහ අනෙක් රටවල් අතර කෙරෙන රාජ්‍යතාන්ත්‍රික ගනුදෙනු සබඳතා, මෙන්න මේ කිව්ව අංශ සම්බන්ධව අර්බුද මතුවීමේ අවදානමකුත් පේනවා. ඇතැම් ඒවා තාක්ෂණික වශයෙන් ඇතිවෙන්න පුළුවන් දෝෂ. අනෙක් ඒවා පාවිච්චි කිරීමේදී භාවිත කිරීමේදී ඇතිකර ගන්නා වූ නොයෙකුත් විපරීත තත්ත්වයන් නිසා අර්බුද මතුවෙන්න ඉඩකඩ තියෙනවා.

සමස්තයක් වශයෙන් සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බැලුවොත් ළමයින් සහ වැඩිහිටියන් අතර අක්මාව හෝ වකුගඩු සම්බන්ධව, ඊට බලපාන රෝගාබාධයන් පිළිබඳ වැඩි වශයෙන් අහන්න දකින්න ලැබෙයි. එහෙම නැතිනම් එවැනි රෝග හටගැනීමේ හා එවැනි රෝග මතුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනවා. මම නිතරම කියලා තියෙනවා නක්ෂත්‍ර පිහිටීම් හරියට කියවා ගත්තොත්, විශේෂයෙන්ම රෝගාබාධ පිළිබඳ බොහෝ සේ නිවැරදිවම පුරෝකථනය කරන්න පුළුවන් බව. ඒ නිසාම තමයි පුරාණ කාලේ වෛද්‍යවරු මේ විෂය ඉගෙන ගත්තේ. ඒ කියන්නේ වෙදකමයි නක්ෂත්‍ර විද්‍යාවයි එකටයි ගියේ. ඒක බටහිර - පෙරදිග කියලා වෙනසක් නෑ. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා හිපොක්‍රටීස් නක්ෂත්‍රවේදියෙක්. ඔහු කියනවා වෛද්‍ය ක්ෂේත්‍රයට මේ විෂය අත්‍යාවශ්‍යයි කියලා. ඔහු ඒක අවධාරණය කරනවා. දැන් ඒවා කැඩිලා තියෙන්නේ. නමුත් සම්ප්‍රදායික පාරම්පරික වෙද මහත්වරු අතර යම් ප්‍රමාණයකට අදත් තියෙනවා ඒක. කොහොම නමුත් අපි ඒක යහපත් දෙයකට පාවිච්චි කරන්න ඕනේ.

ඊළඟට මේ බලපෑම ඇතිවන කාලය ගැන සඳහන් කළ යුතුයි. ඒ වගේම කොහෙද මේක හටගන්නේ? ලංකාවේ. කාලය ගැනත් කියන්න ඕනේ. කාලය නොකිව්වොත් ඒ පුරෝකථනය සම්පූර්ණ නැහැ. 2026 ජූලි 07 සිට සැප්තැම්බර් 07 දක්වා තමයි මේ සමස්ත කාලය පෙන්නන්නේ. මම මේ කිව්ව පුරෝකථනවල වලංගුභාවය තියෙන්නේ. නමුත් ජූලි 07 සිට අගෝස්තු 22 දක්වා තමයි එහි තීව්‍ර කාලය. ඒ කියන්නේ පීක් ටයිම් එක. තීව්‍ර කාලය තියෙන්නේ ජූලි 07යි අගෝස්තු 22යි දක්වා. නමුත් සමස්ත කාලය සැප්තැම්බර් 07 දක්වා යනවා. මේ කාලයේදී අපි එළැඹසිටි සිහියෙන් ඉන්න එක පොදු ජනයාගේ වැඩක්. මොකද අපි දේශපාලනඥයෝ නෙමෙයි, දේශපාලන නායකයෝ නෙමෙයි, බලය ගන්න හදන අයත් නෙමෙයි. අපිට දේශපාලන අරමුණු නැහැ. අපි සාමාන්‍ය පුරවැසියෝ. එතකොට ලොකු ලොකු තැන්වලින් කෙරෙන වැඩ නිසා අපි අපේ මොළේ නරක් කරගන්න හොඳත් නැහැ, ඕවාට කලබල වෙන්නත් හොඳ නැහැ, කිපෙන්න හොඳත් නැහැ, එළැඹසිටි සිහියෙන් ඉන්න එක හොඳයි. ඒ වගේම තම තමන්ගේ කායික හා මානසික සෞඛ්‍ය රැකගන්නත්, තම තමාගේ බුද්ධිමය ක්‍රියාකලාපයන් සබුද්ධික ලෙස පවත්වා ගැනීමටත් අපි වගබලා ගන්න ඕනේ.

ඉතින් මේ කියන එකේ තියෙන වැදගත්කම තියෙන්නේ පොදු පුරවැසියන්ටයි. අපි මේ තත්ත්වයන්ට රැවැටෙන්නෙ නැතුව මේ තාවකාලික විපරීත රැලිවලට නොමග යන්නෙ නැතුව අපේ ආත්මීය සංයමය, වාචසික සංයමය, කායික සංයමය සහ අපේ ආරක්ෂාව රැකගෙන අපිත් වැඩක් කරගෙන රටටත් වැඩක් කරගෙන සාමකාමී තත්ත්වයකට පත්වෙන්න තමයි මේ පණිවුඩය දෙන්නේ.

ඊළඟට සමස්තයක් වශයෙන් රටට මම දකින දෙයක් තියෙනවා. මේක මේ දිව්‍ය වාක්‍යයක් නෙමෙයි. දෙවියන්ගෙන් අහලා කියනවා නෙමෙයි. මේක ගණිතමය වශයෙන් කෙරෙන පුරෝකථනයක්. එතකොට අපි ඒ ඒ ග්‍රහ පිහිටීම් බලලා මෙහෙම වෙන්න පුළුවන් කියන එක කියන්නේ සිද්ධාන්ත ඇතිවයි, න්‍යාය භාවිතයක් ඇතිවයි. මේවා කොච්චර බරට සිද්ධ වෙනවද කොච්චර අඩුවට සිද්ධ වෙනවද කියන එක නෙමෙයි වැදගත්කම තියෙන්නේ. මෙවැනි අනතුරක් තියෙනවා, අවදානමක් තියෙනවා, අන්න ඒ අවදානමට සූදානමින් සිටීම තමයි වැදගත්ම පණිවුඩය. ඉතින් බුද්ධිමත් පාඨකයන් හැමදාමත් ඒ පණිවුඩය ගන්නවා. මේ විෂය පිළිගන්න අයටත් නොපිළිගන්න අයටත් විවිධ වූ දේශපාලන මතවාදවල ඉන්න අයටත් ගන්නවා නම් පණිවුඩයක් මේ තුළ තියෙනවා. කොහොම වෙතත් අපි හැමෝටම ඇත්තටම විපරීත කාලයක් එන්නේ. පරිස්සම් වෙමු.




සැකසුම
චානක ලියනගේ

පරණ උපාධි පාඨමාලා 12,000ක් කුණු කූඩෙට

# ලංකාව අසැබි වෙබ්වල පැටලෙද්දි චීනය ඉස්කෝලෙට අධිතාක්ෂණය අරන් එයි





'ඔය කතා ගිහිල්ලා කියපල්ලා කොණ්ඩේ බැඳපු චීන්නුන්ට' යැයි අපූරු රසවත් කියමනක් අපේ ජනවහරේ ඇත. මෙයින් අර්ථවත්වී ඇත්තේ අතීතයේ සිටි කොණ්ඩේ බැඳපු චීන මිනිසුන් යම් රැවැටීමකට ලක්කළ හැකිය යන්නය. එය කෙතරම් සත්‍යදැයි නොදනිමි.

**ජනගහනය අතින්ද එමෙන්ම ප්‍රමාණය අතින්ද ලෝකයේ දෙවැනි විශාලම රාජ්‍යය ලෙස සැලකෙන චීනය, නිරන්තරයෙන්ම විවිධ නව තොරතුරු ලොවට දායාද කරන රටක් වෙයි. 7 වැනි සියවසේදී නිර්මාණය කරන ලද අදටත් ලෝකයේ පුදුම හතෙන් එකක් ලෙස සැලකෙන චීන මහා ප්‍රාකාරයද අදහාගත නොහැකි විස්මිත ඉදිකිරීමකි. අතීතයේ චීන අධිරාජ්‍යයන් විසින් සිදුකළ විස්මිත දෑ පසුකාලීනව චීනයේ නූතන රාජ්‍ය පාලකයන් විසින්ද සිදුකළේය. එනම් චීනයේ කොමියුනිස්ට් රාජ්‍ය පාලනය මාඕ සේතුං නමැති විශිෂ්ට රාජ්‍ය පාලකයා විසින් ස්ථාපිත කර දැනට වසර 75ක කාලයක් ගෙවී ගොස් අවසානය. කොමියුනිස්ට් පාලනය ආරම්භයේ දුගී තත්ත්වයක තිබුණු චීනය කාලය ගතවෙත්ම ලෝකයේ ධනවත්ම රාජ්‍යයක් බවට පත්වූ අතර, ලෝක බලවතුන් දෙතුන් දෙනා අතරටද එක්වූයේය. ඇමෙරිකාවේ පවා දෙනෙත් විවර කරවන මහා විශ්මකර්ම රාශියක් දායාද කිරීමට ඔවුන් සමත් විය. 'කොණ්ඩේ බැඳපු චීන්නු' කලකින් 'චීන කෙරුමෝ' බවට පත්වූහ.**

චීනයේ පුරාවෘත්තයක් ගැන ලියා තබමින් මෙම කතාව ආරම්භ කිරීමට හේතු වූයේ ඇයි? මෙයට දින කිහිපයකට ඉහතදී අපට චීනය හරහාම අසන්නට ලැබුණු එම කතාව අතිශය සුවිශේෂ පුවතක් මවන්නට සමත්ව ඇත. චීනය තුළින් ඇසුණු එම වතගොත ලෝකයේ ප්‍රධාන පෙළේ මාධ්‍ය රැසක් හරහා වාර්තා කර තිබුණේය. මෙම පුවත් මගින් අසන්නට ලැබුණු මෙම අපූරු කතාන්දරය කුමක්ද? එම පුවත් වාර්තා ශීර්ෂයන් මෙසේ ප්‍රකාශ කර තිබිණි.

**'චීනයේ විශ්වවිද්‍යාල රාශියක තිබුණු 'යල් පැනගිය' සාම්ප්‍රදායික උපාධි පාඨමාලා 12,000ක් අත්හැර දැමීමට කටයුතු කරයි. චීනයේ අධ්‍යාපනික බලධාරීන් විසින් මෙම තීරණය ගෙන ඇත්තේ ලෝකයේ ඉදිරි අනාගතයේදී මුහුණ දෙන අධ්‍යාපනික අභියෝගයන් සඳහා මුහුණ දීමටයි. එනම් විශේෂයෙන්ම AI නූතන (කෘත්‍රිම බුද්ධිය) තාක්ෂණය සඳහා මුහුණ දීමට නව අධ්‍යාපනික සැලැස්මක් දියත් කිරීම සඳහායි. මෙය චීනයේ නව පුළුල් අධ්‍යාපනික ප්‍රතිසංස්කරණය ලෙස රජය විසින් හඳුන්වා දී ඇත. කෙසේ හෝ මෙම පියවර 2021 සහ 2025 වසර පහක කාලය තුළ ක්‍රමයෙන් ක්‍රියාත්මක කෙරුණු අතර, 2026 වසර එහි සැබෑ කූටප්‍රාප්තිය ලෙස සැලකිය හැකිය. එනම් මෙම කාලය තුළදී විශ්වවිද්‍යාල සාම්ප්‍රදායික පාඨමාලා 12,000ක් අවලංගු කර හෝ අත්හිටුවා ඇති අතර, ඒ වෙනුවට නව උපාධි වැඩසටහන් 10,000ක් පමණ හඳුන්වා දී ඇත. එයින් අදහස් වන සුවිශේෂ කරුණ නම් රටේ විශ්වවිද්‍යාල වැඩසටහන්වලින් 30%කට වැඩි ප්‍රමාණයක් ගැළපීම්වලට භාජනය වී ඇති බවයි...'**





සජිත් එදා මේම කියද්දී හැමෝම හිනාවුණා

දැන් ඔබ මෙම කතාවේ යම් සන්ධිස්ථානයකට පැමිණ සිටින්නේය. එසේනම් මෙම පුවත් හරහා අපට අවබෝධ වන්නේ කුමක්ද? චීනයේ රාජ්‍ය අධ්‍යාපනික බලධාරීන් විසින් ප්‍රකාශ කරන ලද මෙම නවතම අධ්‍යාපනික සැලසුම හරහා එරට අධ්‍යාපනික ක්ෂේත්‍රය තුළ මහා ප්‍රතිසංස්කරණයක් සිදුවන අතර, එමගින් එරට අධ්‍යාපනය උඩුයටිකුරු කරනු ඇතිය. මෙය අදියර කිහිපයක් හරහා සිදුකෙරෙන අතර, දැනට එම සැලසුම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ඉදිරි අනාගත ලෝකයට ගැළපෙන ආකාරයට සිදුකෙරෙන මෙම ප්‍රතිසංස්කරණය මේ වනවිට ලෝකයේ රටවල් රැසක අධ්‍යාපනික විශේෂඥයන් සහ විශ්ලේෂකයන්ගේ දැඩි අවධානයට ලක්ව ඇත. ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ මෙවැනි ව්‍යාපෘතියක් මෑත කාලයේ ලෝකයේ කිසිදු රටක ක්‍රියාත්මක නොකර ඇති බවයි. එම විද්වතුන්ගේ විශ්ලේෂණයන් මෙසේ කරුණු ගෙනහැර දක්වයි.

**'චීනයේ මෙම නව අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ එරට උසස් අධ්‍යාපනය තුළින් ජාතියේ සංවර්ධන ඉලක්ක සාර්ථක කරගැනීමේ නව ගමනක් යෑම සඳහායි. චීනයට තමන්ගේ රටේ අනාගත සංවර්ධනය දැවැන්ත ලෙස ගොඩනැගීමට වුවමනා වී තිබේ. යල් පැනගිය උපාධි වැඩසටහන් දහස් ගණනක් ඉවත් කර තිබෙන්නේ ඒ හේතුව නිසායි. මෙහිදී ප්‍රධානතම වශයෙන් AI තාක්ෂණයට මුල්තැන දෙමින් ව්‍යාපෘතිය ආරම්භ කර තිබීමත් සුවිශේෂ දෙයක්. මේ මගින් අනාගතයේදී චීනය 'අධිතාක්ෂණික යුගයක්' කරා යෑමට බලාපොරොත්තු වන ආකාරය පැහැදිලිවම පෙනෙනවා. එනම් ඔවුන්ගේ අනාගත කර්මාන්ත රැසක ගෝලීය ප්‍රමුඛයා වීමේ අධිෂ්ඨානය තිබෙනවා. මෙලෙස චීනයේ සාම්ප්‍රදායික උපාධි පාඨමාලා කප්පාදුව සිදුව ඇත්තේ කලා, මානව ශාස්ත්‍ර, විදේශ භාෂා වැනි ගතානුගතික ක්ෂේත්‍රයන් තුළදියි. මේ අතර මේ වනවිටත් චීනයේ විශ්වවිද්‍යාල ගණනාවකම කෘත්‍රිම බුද්ධිය (AI) විෂයට අදාළ නව විෂය මාලා ආරම්භ කර ඇත. චීනයේ තරුණ තරුණියන්ගෙන් 20%ක් පමණ රැකියා විරහිත අතර, කෘත්‍රිම බුද්ධිය මගින් රැකියා වෙළෙඳපළ වේගයෙන් පරිවර්තනය වෙමින් පවතී. උපාධිධාරීන් සංඛ්‍යාව වේගයෙන් ඉහළ ගොස් ඇතත් රැකියා සොයාගැනීමේදී ප්‍රශ්න මතුව තිබේ. චීනයේ වත්මන් කොමියුනිස්ට් රාජ්‍ය පාලකයන් විසින් මෙවැනි නවතම ප්‍රතිසංස්කරණයක් ගෙන ඒමට තීරණය කර තිබෙනවා. මෙවැනි විශාල අධ්‍යාපනික ප්‍රතිසංස්කරණයක් ලෝකයේ කිසිම රටක මෑත කාලයේදී සිදුව නැහැ...'**

මේ ආකාරයට අධ්‍යාපනික ක්ෂේත්‍ර විද්වතුන්ගේ මහත් ප්‍රශංසාවකට ලක්වුණු චීනයේ සිදුකළ වාර්තාගත අධ්‍යාපනික පෙරළියේ තවත් තතු සොයා බලමු. ලොව ප්‍රකට සහ බලගතු රාජ්‍ය නායකයකු ලෙස සැලකෙන චීනයේ වත්මන් ජනාධිපති ෂී ජින්පින්ගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේ මෙම ක්‍රියාවලිය සිදුකර ඇත. ඔහු ප්‍රකාශ කර ඇත්තේ චීනයට ඉදිරි අනාගත ලෝකය ජයගැනීම සඳහා මෙවැනි අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් අත්‍යාවශ්‍ය වන බවයි.

**දැන් ඔබ මෙම කතාවේ යම් හැරවුම් ලක්ෂ්‍යයකට පැමිණ සිටින්නේය. චීනයේ මෙම ක්‍රියාවලිය හරහා එරට උසස් අධ්‍යාපනික ක්ෂේත්‍රයෙන් ඉවත් කර හෝ කපාහැර ඇත්තේ කුමන විෂයන්ද? එනම් කලා, මානව ශාස්ත්‍ර සහ භාෂා වැනි ක්ෂේත්‍රවලින් බොහෝ දුරට ඉවත් වීමට තීරණය කර ඇත. එසේම ව්‍යාපාර කළමනාකරණය, අලෙවිකරණය, රාජ්‍ය පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණය වැනි විෂයයන්ගෙන්ද බොහෝ දුරට ඉවත්ව ඇත. මෙවැනි තීරණ ගැනීමට හේතුව ලෙස අධ්‍යාපනික බලධාරීන් හේතු ප්‍රකාශ කරන්නේ මෙම විෂයයන් රැසක්ම වර්තමානයේ කෘත්‍රිම බුද්ධි තාක්ෂණය හරහා සිදුකළ හැකි බවයි. එසේම මෙවැනි විෂයයන්ගෙන් උපාධි ලබාගත් උපාධිධාරීන්ට රැකියා ප්‍රශ්නයක්ද බලපා ඇති බවයි. එනම් රැකියා සොයාගැනීම අපහසු වී ඇත. මෙවැනි සාම්ප්‍රදායික විෂයයන් කපාහරින විටදී ඒ සඳහා නව විෂයයන් එකතු කිරීම සිදුකර ඇත. එනම් ප්‍රධානතම වශයෙන් AI කෘත්‍රිම බුද්ධි තාක්ෂණය, රොබෝ තාක්ෂණ විද්‍යාව, දත්ත තාක්ෂණ විද්‍යාව නූතන ගුවන් තාක්ෂණ විද්‍යාව වැනි විෂයයන් එකතු කිරීමට කටයුතු කර ඇත. චීනයේ මෙම නව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සලකන්නේ රැකියා සහතික කිරීමේ මාර්ගයක් ලෙස මිස න්‍යාය ඉගැන්වීමක් ලෙස නොවන බවට කරුණු ප්‍රකාශ වී ඇත.**

**චීනයෙන් අධ්‍යාපනය උදෙසා මෙවැනි විස්මිත කතා ඇසෙන විටදී පසුගියදා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ගැන අසන්නට ලැබුණේ කුමක්ද? එය අද කවුරුත් දන්නා අපගේ හයවැනි ශ්‍රේණියේ පෙළපොතකට අසභ්‍ය ලිංගික වෙබ් අඩවියක තොරතුරු ඇතුළු කර තිබීමය. මෙරට අධ්‍යාපන ඇමැති සහ බලධාරීන් නොදැන එවැන්නක් සිදුවිය හැකිද? පිළිතුර ඔබ අතෙහි ඇත.**



ප්‍රියන්ත හෙට්ටිගේ

# ගිය සැරේ ඇතුළේ ඉන්න පාතාලේ දැම්මා

# රටින් පැන්න පාතාලේ

**ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත්කර ඇති ශ්‍රී ලංකිකයන් ගණන 232කි. ඒ අතර පාතාලයේ මත්කුඩු ජාවාරම්කරුවන් සිටින්නේ 96 දෙනෙක් පමණි. ඒ 96 දෙනාගෙන් 37 දෙනෙක් මේ වනවිටත් පැහැදිලිවම ඔවුන් ඉන්නා ස්ථාන සමග හඳුනාගෙන ඇතැයි මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු ඇමැති ආනන්ද විජේපාල මහතා කියයි. ඔහුට අනුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 19 දෙනෙකු, ඉන්දියාවේ 11 දෙනෙකු, මැලේසියාව, එක්සත් රාජධානිය, ප්‍රංශය, කැනඩාව, රුසියාව, ඉතාලිය සහ සෞදි අරාබිය යන රටවල එක් අයෙකු බැගින්ද සැඟව සිටින බව හඳුනාගෙන තිබේ.**

2021ත් 2022ත් අතර කාලය තුළ කිඹුලාඇල ගුණා සමග අත්අඩංගුවට ගත් ප්‍රධාන අපරාධකරුවන් 09 දෙනාත් කුඩු සෙල්වීගේ දරුවන් 03 දෙනාත් ඇතුළු මෙරට අපරාධවලට සම්බන්ධ රතු නිවේදන නිකුත්කර ඇති අපරාධකරුවන් 15 දෙනෙක් පමණ මේ වනවිට සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ අත්අඩංගුවේය. මේ අය ගෙන්වා ගැනීමට කාලයක් තිස්සේ රාජ්‍ය තාන්ත්‍රික උත්සාහයක නිරත වෙයි. එම උත්සාහයන් අදටත් අත්හැර දමා නැත.

ඇමැතිවරයා පවසන රටවල් කිහිපයට අමතරව ඉතාලිය, ජපානය මෙන්ම රුසියානු සමූහාණ්ඩුවෙන් වෙන්වූ අසර්බයිජානය ඇතුළු රටවල් කිහිපයකද මෙරට පාතාල අපරාධකරුවෝ රැඳී සිටිති. ඒ අය අතර ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත් කළ අය නැත්තේම නැත. මේ, එම පාතාල අපරාධකරුවන් ගැන අප කළ සොයා බැලීමකි.






### 01. මොහොමඩ් මුජහිඩ්

මොහොමඩ් මුබාරක් මොහොමඩ් මුජහිඩ් යනු පාකිස්තානය, මැලේසියාව සහ ඩුබායි කේන්ද්‍ර කරගනිමින් ශ්‍රී ලංකාවට මහා පරිමාණයෙන් හෙරොයින් සැපයූ ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. ඔහු ව්‍යාපාරිකයෙක් ලෙස පෙනීසිටිමින් මත්කුඩු ජාවාරම මෙහෙයවූවෙකි. කන්ටේනර්වල සඟවා මෙරටට මත්කුඩු රැගෙනවිත් 'සිලෝන් ටී' ලෙස මැදපෙරදිග කලාපය ඇතුළු රටවල් රැසකට මත්කුඩු බෙදාහැරීමද ඔහු විසින් සිදුකර තිබුණි.

මැලේසියාවේ පුරවැසිභාවයද හිමිව තිබූ ඔහු එරට රජයෙන් පුරවැසියන්ට ලබාදෙන ඉහළම සම්මානයෙන්ද පිදුම් ලබා තිබුණි. මහින්ද රාජපක්ෂ යුගයේදී මෙරට දේශපාලනඥයන් රැසක් කිට්ටුවෙන් ඇසුරු කළ අයෙක් වූ ඔහු 'සෙල්වම්' සහ 'පරාවර්තන' යන සිංහල චිත්‍රපටද නිෂ්පාදනය කළේය.


පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් මොහු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක් බව මෛත්‍රීපාල යුගයේදී අනාවරණ කරගන්නා විට සිටින්නේ මලයාසියාවේය. ජාත්‍යන්තර පොලිසිය මගින් ඔහුට රතු නිවේදනයක් නිකුත් කිරීමත් සමග ඔහු මලයාසියාවේ සිට ඩුබායිවලට පැනගෙන තිබුණි. අදටත් ඔහු ඩුබායි සහ මැදපෙරදිග කලාපයේ රටවල සැරිසරමින් සිටින බව සඳහන්ය.



### 02. අන්නාසි මොරිල්

මොරිල් ඇන්ටනී නොහොත් අන්නාසි මොරිල් සිය බිරිඳ හා දරුවන් සමග ජීවත්වන්නේ ඉතාලියේය. ඒ අතර ඔහු ප්‍රංශය සහ එංගලන්තය අතරද සංක්‍රමණ සිදුකරයි. මත්කුඩු ජාවාරම ඔහු මෙහෙයවනු ලබන්නේ ඩුබායි සිටය. ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙක් වන ඔහු පාතාල ක්‍රියාකාරකම්වලට සම්බන්ධ නැත. මාකඳුරේ මධුෂ් ඩුබායි පොලිසියට හසුකර දෙන්නේද ඔහුය.

කිරුළපන කේන්ද්‍ර කරගෙන 90 දශකයේ සුළු පරිමාණයෙන් මත්කුඩු ජාවාරම මෙහෙයවූවෙකි. ඔහු රටින් පලායන්නේ 2015දීය. විදේශගත වීමෙන් අනතුරුව ඔහු මත්කුඩු ජාවාරම සිදුකරනු ලබන්නේ කිලෝ සිය ගණන්වලිනි.



### 03. කොස්ගොඩ සුජී

ජගමුණි සුජීව ද සොයිසා නොහොත් කොස්ගොඩ සුජී දකුණු පළාතේ කොස්ගොඩ බලපිටිය කේන්ද්‍ර කරගෙන නැඟීසිටි දරුණු පාතාල අපරාධකරුවෙකි. වරක් ඔහු රටින් පලාගොස් ඉන්දියාවේ සැඟව සිට මෙරටට පැමිණෙන විට ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගත්තේය. ත්‍රස්තවාදය වැළැක්වීමේ නියෝග ප්‍රකාරව එකල රැඳවුම් මධ්‍යස්ථානයක් වූ බූස්සේ රඳවාගෙන විමර්ශන පවැවැත්විය. එකල එල්.ටී.ටී.ඊ. සැකකරුවන්ද එහි රඳවා සිටි බැවින් එම සැකකරුවන් සමග ඔහු සම්බන්ධකම් ගොඩනගාගෙන එල්.ටී.ටී.ඊ.යේ වෙඩික්කරුවන් කුලියට ගෙන මිනිස් ඝාතනවල නිරත වූවෙකි. මෙරට ඉතිහාසයේ එල්.ටී.ටී.ඊ. වෙඩික්කරුවන් යොදාගත් පළමු පාතාල අපරාධකරු ඔහු වේ.

2011 වසරේදී සිය බිරිඳ සමග රටින් පනින සුජී සිංගප්පූරුව, ඉන්දියාව යන රටවල් හරහා ඩුබායි ගොස් බොහෝ කාලයක් එහි වාසය කළේය.

පසුව බිරිඳ හා දරුවන් සමග යුරෝපා රටකට පලාගිය සුජී සිය මත්කුඩු ජාවාරම ඩුබායි කේන්ද්‍රකරගෙන සිදුකරන බව සඳහන්ය.

කොස්ගොඩ සුජී යනු ශ්‍රී ලංකාවේ දකුණු පළාත කේන්ද්‍ර කරගනිමින් මිනීමැරුම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ කප්පම් ගැනීම් ඇතුළු බරපතළ අපරාධ රැසක් මෙහෙයවන ප්‍රධාන පෙළේ සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයෙකි. ඔහු වර්තමානයේ විදේශගතව (ප්‍රධාන වශයෙන් ඩුබායි රාජ්‍යයේ) සැඟවී සිටිමින් මෙරට අපරාධ ජාලය ක්‍රියාත්මක කරයි.



### 04. එස්.ටී.එෆ්. නඳුන්

කොස්ගොඩ සුජී පාතාලයට අතපොත් තැබුවේ ප්‍රදීප් දේවා නඳුන් ධර්මවික්‍රම නොහොත් එස්.ටී.එෆ්. නඳුන්ගෙනි. ඒ, නඳුන්ගේ මස්සිනා වූ සිය හොඳම මිතුරා මරාදැමූ ඝාතකයන්ගෙන් පළිගැනීමටය. නඳුන් ඒ වනවිට පොලිස් විශේෂ කාර්ය බළකායේ උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස සේවයේ නිරතව සිටිමින් පාතාලය සමග ගනුදෙනු කර තිබුණි. ඔහු පාතාලයට ගිනිඅවි අලෙවි කිරීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමෙන් පසු පූර්ණකාලීනව පාතාලයට හවුල් වූ බව පොලිස් තොරතුරු සඳහන් කරයි.

90 දශකයේ අග රටින් පනින නඳුන් ඉතාලියේ මේ වනවිට ජීවත් වෙයි. ඉතාලි මිලානෝ පොලිසිය 2013 වසරේදී ඔහුව පහරදීමක් සහ සොරකමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබීය. ඒ වන විට ඔහුට එරෙහිව රතු නිවේදනයක් පවා නිකුත්කර තිබුණද අදටත් ඉතාලියෙන් ඔහුව මෙරටට භාරදුන්නේ නැත.

### 05. ශිරාන් බාසික්

මොහොමඩ් ශිරාන් බාසික් නොහොත් ශිරාන් බාසික් ගල්කිස්ස සහ දෙහිවල කේන්ද්‍ර කරගෙන මත්කුඩු ජාවාමට පිවිසි අංක එකේ මත්කුඩු ජාවාරම්කරුවෙකි. වසර 20කට පමණ පෙර රටින් පැනගත් ඔහු ඩුබායිහි රැඳී සිටිමින් මත්කුඩු ජාවාරම මහා පරිමාණයෙන් මෙහෙයවනු ලබන්නේ ඉරාන ජාවාරම්කරුවන් සමග සෘජුව සම්බන්ධ වෙමිනි.

හෝටල් ව්‍යාපාර හරහා මුදල් විශුද්ධිකරණය මෙරට සිදුකරන ඔහු ඩුබායිහි රැඳී සිටින්නේද ව්‍යාපාරිකයෙක් ලෙසිනි. පසුගිය පළාත් පාලන මැතිවරණ සමයේදී අලුත් දේශපාලන පක්ෂයක් විසින් කොළඹ සංවිධාන කළ රැලියකට වැඩිපුර පිරිස් රැගෙන ගියේ ඔහුගේ සම්බන්ධීකරණයෙන් දෙහිවල සහ ගල්කිස්සේ පිරිස් රැගෙන යමිනි. ඔහු ඩුබායි සිට ගල්කිස්ස සහ දෙහිවල වැසියන් විශාල පිරිසකට මාසයකට වරක් සලාක ලබාදෙන බවද සඳහන්ය.

ශිරාන් බාසික් ඉකුත් මැයි මාසයේදී ඩුබායි පොලිසියට හසුවී ඇත. ඒ ගැන මෙරටට නිල වශයෙන් මෙතෙක් දැනුම්දීමක්ද කර නැත.




### 06. ගොනාකෝවිලේ අංජු

සිංහාරගේ අමල් සමින්ද සිල්වා නොහොත් ගොනාකෝවිලේ අංජු රත්මලාන කේන්ද්‍ර කරගෙන 2016 වසරේ සිට ක්‍රියාත්මක වූ පාතාල අපරාධකරුවෙකි. ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. අංජු පාතාලයට වැටෙන්නේ කඩවත පිහිටි මහර අධිකරණය අසලදී 2016 වසරේදී සිය සහෝදරයා වූ ලංසියා ඝාතනය වීමත් සමගිනි.

එම ඝාතනය ගොනාකෝවිලේ රොහා විසින් සිදුකර තිබුණේ දීර්ඝ කාලයක් තිස්සේ පැවැති ආරවුලක ප්‍රතිඵලයක් ලෙසිනි. දෙපාර්ශ්වය අතර පැවැති එම ගැටුමෙන් ඒ වනවිට විසි තිස් දෙනෙක්ම මියගොස් තිබුණි. ලංසියා ඝාතනය කිරීමෙන් සෑහීමට පත්නොවූ රොහා විසින් අංජුටද ඉව ඇල්ලුවේය. ඒ වනවිට කිසිදු පාතාල ක්‍රියාකාරකමකට සම්බන්ධයක් නොවූ අංජුට සිදුවන්නේ ජීවිතාරක්ෂාව පතා සිංගප්පූරුවට පැන යන්නටය.

ලංසියා වටා සිටි ගෝලබාලයන් අංජු වටා ඒ වනවිට එකතු කරන්නේ ඇල්ටෝ ධර්මෙ විසිනි. අංජු සිංගප්පූරුවේ රැඳීසිටින අතරතුර අපරාධ රැසක් ඔහුගේ අනුදැනුම මත සිදුවුවත් රටේම අවධානය යොමුවන්නේ ක්‍රිකට් ක්‍රීඩක ධනංජය ද සිල්වාගේ පියාව 2018 වසරේදී ඝාතනය කිරීමත් සමගිනි. ඒ වනවිට අංජු රැඳී සිටින්නේ ඩුබායිවලය.

පසුව ඔහු සිය බිරිඳවද රැගෙන ප්‍රංශයට පැනගන්නා අතර දේශපාලන රැකවරණයද ඉල්ලා තිබුණි. දැන් ඔහු එරට රැඳී සිටින්නේ ප්‍රංශ ජාතික බිරිඳක් සමග වන අතර ප්‍රංශ පොලිසියද ඔහුව අත්අඩංගුවට ගෙන නිදහස්කර තිබුණේ රතු නිවේදනයක් පවා තිබියදීය.



### 07. ඇල්ටෝ ධර්මේ

එල්ලාවල ලියනගේ ධර්මසිරි පෙරේරා හෙවත් ඇල්ටෝ ධර්මේ යනු ශ්‍රී ලංකාවේ මහාපරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබූ ප්‍රධාන පෙළේ පාතාලයේ ප්‍රබලයෙකි. ඔහු රටින් පනින්නේ 2018 වසරේදී ක්‍රිකට් ක්‍රීඩක ධනංජය සිල්වාගේ පියා ඝාතනය කරමිනි. අංජු වෙනුවෙන් ඩුබායි සිට මත්කුඩු ජාවාරම සහ පාතාල කටයුතු මෙහෙයවනු ලබන්නේ ඇල්ටෝ ධර්මේ විසිනි.

වරක් ඔහු අබුඩාබිහිදී එරට පොලිසියට හසුවී නිදහස ලබන්නේ රතු නිවේදකයක් තිබියදීය. මේ වනවිට ඔහු සිය ගෝලයන් 03 දෙනෙක් සමග ඩුබායි පොලිස් අත්අඩංගුවේ සිටින අතර, එරට පවතින නඩු කටයුතු අවසන්වූ වහාම මෙරටට පිටුවහල් කරනු ඇති බවට විශ්වාස කරයි.

### 08. කුඩු ලාල්

මහ පරිමාණයේ මත්කුඩු ජාවාම්කරුවෙක් යැයි ඔහුව හඳුන්වනු ලැබුවත් මෙතෙක් ඔහුට එරෙහිව පොලිසියේ කිසිදු මත්කුඩු නඩුවක් ඇතැයි අනාවරණ වන්නේ නැත. ඔහුට රතු නිවේදනද නැත. ඔහුට අපරාධ චෝදනාද නැත.

ඔහු ලංකාවෙන් පලායන්නේ මහින්ද රාජපක්ෂ යුගයේදී සුදු වෑන් රථ කල්ලිය පස්සෙන් පැන්නීමට පටන් ගැනීමත් සමගිනි. මේ වනවිට එංගලන්තයේ ජීවත්වන ඔහු එරට ව්‍යාපාර කටයුතුවල නිරතව සිටී. පසුගිය ආණ්ඩුවල ප්‍රබල දේශපාලනඥයන් සමග ඉතා සමීපව සම්බන්ධකම් පවත්වන අයෙක් වන ඔහු වසර 20කින් පමණ ලංකාවට පැමිණ නැති බව සඳහන්ය.



### 09. කංජිපානි ඉම්රාන්

මොහොමඩ් නජීම් මොහොමඩ් ඉම්රාන් නොහොත් කංජිපානි ඉම්රාන් මේ වනවිට රැඳී සිටින්නේ යැයි සඳහන් වන්නේ ප්‍රංශයේය. ඔහු ප්‍රංශයට පනින්නේ 2022 වසරේ දෙසැම්බර් 20 වැනිදා අධිකරණයෙන් ඇප ලැබී නිදහස ලැබීමෙන් අනතුරුවය. බෝට්ටුවක නැගී ඉන්දියාවට පැනගත් ඔහු පසුව ඩුබායි ගොස් එතැනින් ප්‍රංශයට ගිය බව සඳහන්ය.

මාලිගාවත්ත ප්‍රදේශය කේන්ද්‍ර කරගත් මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවූ ඔහු මිනීමැරුම් රැසක මහමොළකරුවෙකි. ලංකාවට මහා පරිමාණයෙන් මත්කුඩු එවන ජාවාරමේ ඔහු දැන් ප්‍රබලයෙකි.

### 10. මොහොමඩ් සිද්දික්

ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන මොහොමඩ් මකීන් මොහොමඩ් සිද්ධික් නොහොත් කුඩු සිද්ධික් මෙරට මත්කුඩු ජාවාරමේ අංක එකේ පුද්ගලයෙකි. 2015 මාර්තු 19 වැනිදා පාකිස්තානයේදී අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුව මෙරටට රැගෙන ආවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් පාකිස්තානයට ගොසිණි. ඒ, වෙලේ සුදාගේ ඔත්තුවකිනි.

වසර තුනකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටි සිද්ධික් 2018 සැප්තැම්බර් මාසයේදී කොළඹ මහාධිකරණය විසින් ඔහුට එරෙහිව පැවති කුඩු නඩුවලින් නිදොස් කොට නිදහස් කරන ලදී. පසුව 2019 දී ඔහු ඇප මත මුදාහැරීමෙන් පසු නැවතත් රටින් පලාගියේය. ඕමානයේදී ඔහු 2023 අවුරුද්දේ අගෝස්තුවේදී නැවත කොටුවුවත් මෙරටට භාරදීමක් සිදුවූයේ නැත. ඒ, ඔහු සතුව ඒ වනවිට තිබී ඇත්තේ ඉන්දියානු ගමන් බලපත්‍රයක් වූ බැවිනි.



### 11. රොටුඹ අමිල

සේපාල රත්නායකගේ අමිල සම්පත් නොහොත් රොටුඹ අමිල මෑත කාලයේ නිතර නම කියැවුණු පාතාලයේ ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. මාකඳුරේ මධුෂ්ගේ දියණියගේ උපන්දින සාදයට ගොස් ඔහුද හසුවූ අයෙකි.

2019 මාර්තු 28 වැනිදා කංජිපානි ඉම්රාන් සමගම ඔහුවත් මෙරටට පිටුවහල් කරන ලදී. බන්ධනාගාරගතව කාලයක් සිටි ඔහු ඇප ලැබීමෙන් පසු රටින් පැන්නේය. ඔහු දැන් සිටින්නේ රුසියාවේය. 2025 මාර්තු මාසයේදී රුසියාවේදී එරට ආරක්ෂක අංශ විසින් දේශසීමා පනින්නට ගොස් අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔහු තාමත් සිටින්නේ රුසියානු ආරක්ෂක අංශ භාරයේය. ඔහුට එරෙහිව එරට ඇති නඩු කටයුතු මේ වනවිට අවසන්ව ඇති බැවින් ළඟදීම ඔහුව මෙරටට භාරදෙනු ඇත.



### 12. කුඩු සලිඳු

සලිඳු මල්ෂිත ගුණරත්න හෙවත් කුඩු සලිඳු පානදුර කේන්ද්‍ර කරගෙන මත්කුඩු ජාවාරම මෙහයවූවෙකි. මැඩගස්කරයේ සිට 2023 මාර්තු 15දා මෙරටට රැගෙන ආ ඔහු 2024 වසරේ දෙසැම්බර් 20 වැනිදා අධිකරණයෙන් ඇප ලැබී පැය 24ක්වත් මෙරට රැඳී සිටියේ නැත. නැවත රටින් පැන්නේය.

ඉන්දියාවට බෝට්ටුවකින් පැනගිය ඔහු එතැනින් මැදපෙරදිග රටකට පැනගත්තේය. දැන් ඔහු යුරෝපීය රටක සිටින බව කියනුයේ මත්ද්‍රව්‍ය ජාවාරම මහා පරිමාණයෙන් සිදුකරමිනි. මොහු පොලිසියේ ඉහළම අයකු සමග ඉතා කිට්ටුවෙන් සම්බන්ධකම් පැවැත්වූවෙකි. ඇප ලබාගෙන රටින් පැනීමට ඒ පුද්ගලයාගෙන් සහායක් ලැබුණු බවට සැකයක්ද පවතී.



### 13. පරෙයි සුද්දා

ගල්ලෙවත්ත ගමගේ චමින්ද දිල්රුක් නොහොත් වනාතේ පරෙයි සුද්දා ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. වෙලේ සුදාගේ තැනට දැන් පත්ව ඇත්තේ ඔහුය. 2019දී අතුරුගිරිය අධිවේගී මාර්ගයේදී හෙරොයින් කිලෝග්‍රෑම් 50ක් සමග පොලිස් අත්අඩංගුවට පත්ව රක්ෂිත බන්ධනාගාරගතව සිටි සුද්දා ඇප මත නිදහස් වීමෙන් අනතුරුව රටින් පැන්නේය. ඩුබායිහි වැඩි කාලයක් ගතකළ ඔහු ජපානයේ ව්‍යාපාරිකයෙක් ලෙස රැඳීසිටින බවට තොරතුරුද පොලිසිය වෙත ලැබී ඇත.

### 14. මතුගම ශාන්

මතුගම කේන්ද්‍ර කරගනිමින් පාතාලයට පිවිසි දොඩම්ගොඩ ලියනගේ ශාන් ආරෝෂ් ජයසිංහ නොහොත් මතුගම ශාන් දේශපාලන හා පොලිස් සම්බන්ධකම් නොඅඩුව ඇති අයෙකි. ඔහු කළුතර ප්‍රබල දේශපාලනඥයන් ඉතා කිට්ටුවෙන් ඇසුරු කරමින් ඔවුන්ගේ දේශපාලන කටයුතු සඳහා උදව් උපකාර කළ අයෙක් ලෙස හඳුනාගෙන තිබේ.

හිටපු පොලිස්පතිවරයෙක් සමග ඉතා කිට්ටුවෙන් ඇසුරු කළ අයෙකි. සිංගප්පූරුව, මලයාසියාව, ඩුබායි ආශ්‍රිතව සැරිසරමින් සිටින ඔහු මේ වනවිට යුරෝපීය රටක සිටින බවද සඳහන්ය.



### 15. ආමි අසිත

දික්පිටිය විතානගේ අසිත නොයෙල් හෙවත් ආමි අසිත කුලී ඝාතකයෙකි. මාකඳුරේ මධුෂ්ගේ සැලසුමකට අනුව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ වැටලීම් අංශයේ ස්ථානාධිපතිවරයාව සිටි නියෝමාල් රංගජීවට 2017 මැයි 19 වැනිදා පිළියන්දලදී වෙඩි තබන්නේ ඔහුය. එම ඝාතනයත් සමග ඉන්දියාවට බෝට්ටුවකින් පනින ඔහු තවමත් ඉන්නේ ඉන්දියාවේය.

එරට ජාතික විමර්ශන ඒජන්සිය තමිල්නාඩුවේ තිරුචිරප්පල්ලි විශේෂ සරණාගත කඳවුරේ කළ විශේෂ මෙහෙයුමකදී 2022 දෙසැම්බර් මාසයේදී ඔහු අත්අඩංගුවට පත්විය. ඒ පාකිස්තානය සමග කරනු ලබන මත්කුඩු ජාවාරමක් සම්බන්ධයෙනි. අදටත් ඔහු සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ භාරයේය. ඔහුව අත්අඩංගුවට ගැනීමට මග පෑදෙන්නේ කුඩු නවාස්ගේ ඔත්තුවකි.

### 16. කුඩු නවාස්

එම්.එම්.නවාස් නොහොත් කුඩු නවාස් 2017 වසර වන විට මීගමුව කේන්ද්‍රකරගෙන සුළු පරිමාණයෙන් මත්කුඩු ජාවාරමේ නිරතවූවෙකි. මාකඳුරේ මධුෂ්ගේ සැලසුමකට අනුව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නියෝමාල් රංගජීව ඝාතනය කිරීමේ සැලසුමේ ප්‍රධාන භූමිකාවක් ඉටුකරනු ලබන්නේ ඔහුය. ඒ මධුෂ්ගේ මත්ද්‍රව්‍ය ජාවාරමක් හසුකර දෙන්නැයි කියා රංගජීව පිළියන්දලට රැගෙන ගොස් වෙඩික්කරුට ඉලක්කය ලබාදීමෙනි.

රංගජීවට වෙඩිතැබීමෙන් දින කිහිපයකට පසු බෝට්ටුවක නැගී ඉන්දියාවට පලායන ඔහු ඉන්දියානුවෙක් ලෙස වෙස් ගෙන එහි ජීවත්වන්නේ රෙදිපිළි ව්‍යාපාරිකයෙක් ලෙසිනි. ඒ අතර ඔහු පකිස්තාන් සහ ඇෆ්ගනිස්තාන් ජාවාරම්කරුවන් සමග මත්කුඩු ජාවාරමේ නිරතව ඇත්තේ චෙන්නායි කේන්ද්‍ර කරගෙනය. එම මත්කුඩු ජාලය ගැන ඉන්දියානු මත්ද්‍රව්‍ය නාශක අංශයට කරුණු හෙළිවන්නේ හෙරොයින් කිලෝ 96ක් සහ ගිනි අවි රැසක් සමග 2020 නොවැම්බර් මාසයේදී ඉන්දියානු වෙරළාරක්ෂක බළකායට හසුවන 'ෂෙනායා දුව' යාත්‍රාව සම්බන්ධයෙන් කළ වැඩිදුර විමර්ශනයේදීය. ඒ අනුව ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් 2021 දී අත්අඩංගුවටගත් නවාස් තවමත් සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ භාරයේය.



### 17. කිඹුලාඇළ ගුණා

සින්නයියා ගුණසේකරන් නොහොත් කිඹුලාඇල ගුණා එල්.ටී.ටී.ඊ.ය සමග සම්බන්ධකම් පැවැත්වූ කොළඹ රජකළ ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. ඉන්දියාව සහ ලංකාව අතර මත්කුඩු ජාවාරමේ නිරතව සිටි ආරම්භක පුරුකකි.

දැඩි දේශපාලන සම්බන්ධකම් මෙන්ම පොලිසියේද සම්බන්ධකම් ඇතිව කොළඹ රජකළ කිඹුලාඇල ගුණා 1999 දෙසැම්බර් 18දා එවක හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට කොළඹ පුරහල භූමියේ පැවැති ජනපති මැතිවරණ වේදිකාවේදී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එල්ලකිරීමටද සම්බන්ධ බව කියැවිණි.

මහින්ද රාජපක්ෂ යුගයේදී ඔහුගේ සහෝදරයා වැලිකඩ බන්ධනාගාරය අසලින් පැහැරගෙන ගොස් දොම්පේ පැත්තේ සුසාන භූමියකදී වෙඩිතබා මරාදැමීමත් කිඹුලාඇල ගුණාගේ මෙහෙයවීම මත සිදුවූවක් බව කියැවේ.

මෝදර කිඹුලාඇල පිහිටි සිය රාජධානියට සන්නද්ධ කණ්ඩායම් කඩාවැදී පහරදී ඔහු විසින් පවත්වාගෙන ගිය පාතාලයේ උසාවිත් පොලිසියත් කුඩුකර දැමීමෙන් අනතුරුව ජීවිතාරක්ෂාව පතා හැමිට්ටන් ඇළ දිගේ බෝට්ටුවක නැගී පලායන ඔහු මතුවන්නේ ඉන්දියාවේ චෙන්නායිවලිනි.

එහි සිට මත්කුඩු ජාවාරම මෙහෙයවමින් සිටි ඔහුව ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශයට පාවා දෙන්නේ නවාස් විසිනි.

ඒ බව දැනගත් කිඹුලාඇල ගුණා සිය පුතාත් සහෝදරයාත් හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙක් වන පුද්ගලික ආරක්ෂකයාත් සමග දිල්ලියට පැනගැනීමට සූදානම් වනවිට 2022 ජනවාරි 31 වැනිදා චෙන්නායි ගුවන් තොටුපළේදී ඉන්දීය මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් අත්අඩංගුවට ගත්තේය. තාමත් ඔහු ඇතුළු පිරිස සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ අධීක්ෂණය සහිතවය.



### 18. බුම්මා

ස්ටැන්ලි කෙනඩි ප්‍රනාන්දු හෙවත් බුම්මා එල්.ටී.ටී.ඊ.යේ හිටපු වෙඩික්කරුවෙකි. කොස්ගොඩ සුජීගේ සැඟවුණු වෙඩික්කරුවෙක් ලෙස කාලයක් කටයුතු කළ ඔහු දකුණේ සහ කොළඹ සිදුවූ ඝාතන රැසකට සම්බන්ධ වූවෙකි.

ඔහුගේ උපන් ගම ලෙස සැලකෙන්නේ කොළඹ කොච්චිකඩේය. 2002 සාමගිවිසුම ක්‍රියාත්මක වූ කාලයේදී ඔහු ළමා සොල්දාදුවෙක් ලෙස එල්.ටී.ටී.ඊ.යට බැඳී ඇති බව කියයි. එලිලෝවන් ඔහුගේ එල්.ටී.ටී.ඊ. නාමයයි.

කොළඹ මහනගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් වන ක්‍රිෂ්ණ කොටහේනේ පිහිටි ඔහුගේ වෙළෙඳසලේදී 2018 ජූලි 09 වැනිදා බුම්මා විසින් ඝාතනය කිරීමත් සමග ඔහු පස්සේ පොලිසිය පන්නන්නට ගත්තේය. පිටරටකින් ලද කොන්ත්‍රාත්තුවකට අනුව ඔහු එම ඝාතනය කර තිබුණි.

පොලිසියෙන් සිය ජීවිතය ආරක්ෂා කරගැනීමට බුම්මා ඒත් එක්කම ඉන්දියාවට පැන්නේය. ඒ බෝට්ටුවක නැගීය. ඉන්දියාවේදී රැකවරණය ලබන්නේ කිඹුලාඇල ගුණාගේ සහෝදරයා වූ සුරේෂ්ගෙනි.

ඔහු බුම්මාගේ පාසල් මිතුරාය. ඉන්දියාවේ සිට මත්කුඩු ජාවාරමට සම්බන්ධ වන්නේ කිඹුලාඇල ගුණාගේ ගෝලයන් සමගිනි. කිඹුලාඇල ගුණා අත්අඩංගුවට ගැනීමත් සමග ඔහුද ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශය මගින් අත්අඩංගුවට ගත්තේය. තවමත් ඔහු ඉන්දියානු ආරක්ෂක අංශ අධීක්ෂණය යටතේ සිටියි.



### 19. කොට ගාමිණී

අලහප්පෙරුමගේ සුනිල් ගාමිණී ෆොන්සේකා හෙවත් කොට ගාමිණී පාතාලයේ කුලී ඝාතකයෙකි. ඔහු වැඩිහරියක් සිදුකළේ කිඹුලාඇලේ ගුණාගේ කොන්ත්‍රාත්ය. මිනිස් ඝාතන චෝදනා පමණක් 15කට වැඩි ප්‍රමාණයක් ඔහුට එල්ලවී ඇත. 2005 වසරේදී එවක බස්නාහිර පළාත් සභාවේ ඇමැතිවරයෙක් වූ සුනිල් මෙන්ඩිස් මහතා රාගම සිය නිවසේදී ඝාතනය කිරීමෙන් අනතුරුව ඔහු ඉන්දියාවට පැනගන්නේ කිඹුලාඇල ගුණා සමගිනි. ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශයට ඔහු හසුවන්නේ කිඹුලාඇළ ගුණාගේ ජාලය පස්සේ පන්නමින් යමින් සිටියදීය.

*රුවන් වෙඩිවර්ධන*

*(ඉතුරු කොටස ලබන සතියට)*